# 2022.10.25 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
10.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
11. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
13.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදී සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
14.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
15.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
16.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
17.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
19.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
23. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය
28.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
29.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
30.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා
31.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා

### රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්

01. ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
02.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා

04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

- **ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී.2022 ඔක්තෝබර් 25 දින 2023 වර්ෂයේ අයවැය සම්බන්ධ විශේෂ මහා සභා රැස්වීමට සහභාගී වන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය, ලේකම් ඇතුළු කාර්යමණ්ඩල නිලධාරීන්, මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම - නැත**

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත**

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සංනිවේදන - නැත.**

**04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

**I.2023 වර්ෂයේ අයවැය ඉදිරිපත් කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඉතාම දුෂ්කර කාල පරිච්ඡේදයක් පසුගිය කාලයේ ගත කළේ. අපි විශාල ව්‍යසන, රෝගවලට, විවිධ ආර්ථික ගැටලුවලට රටත් පළාත් පාලන ආයතනයක් විදියට අපිත් මුහුණ දීලා තිබුණේ. ව්‍යසන, රෝගවලදී විශේෂයෙන්ම අපේ හිටපු ගරු සභාපතිතුමා සුනිල් ජයවීර මහතා ජීවිතක්ෂයට පත් වුණා.කණගාටුදායක අවස්ථාවක්.ඒ වගේම රටේ සාමාන්‍ය කටයුතු අකර්මණ්‍යතාවයට පත්වුණා. සභාවේ කටයුතුත් අකර්මණ්‍යතාවයට පත්වුණා.පසුව උප සභාපතිවරයා විදියට මම වැඩ බලන සභාපතිවරයා විදියටත් ඊට පසුව පළාත් පාලන කොමසාරිස්තුමා එතුමාට පැවරී ඇති බලතල අනුව මෙම ස්ථානයට පැමිණිලා නීත්‍යානුකූලව සභාපතිවරයෙක් පත් කිරීමට නිලවරණයක් පැවත්වුවා.එම නිලවරණයේදී බහුතර ඡන්දයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට මාව නීත්‍යානුකූලව පත් කරගත්තා.ඒ වගේම සභාව පවත්වාගෙන යාමේදී යම් යම් අර්බුදකාරී අවස්ථාවන්වලට මම මුහුණ දුන්නා.එසේ වුවත් මම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට මගේ නීත්‍යානුකූල භාවය තුළ කටයුතු කළා.ඒ අනුව මට නන් අයුරින් සහයෝගය දීපු පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කටයුතු කළා. ඒ නිසා මම බොහොම නිහතමානීව ඔබතුමන්ලා මට ලබාදීපු සහයෝගය පිළිබඳව විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා, සමගි ජන බලවේගය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා /තුමියන්ලා, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා, මුස්ලිම් කොංග්‍රසය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා සංජීව කරුණාසාගර මහතා තනි මන්ත්‍රීවරයෙක් විදියට වුණත් එතුමාගේ දේශපාලන පක්ෂ භූමිකාවේ සිට අපිට ලබාදිය හැකි සහයෝගය ලබා දුන්නා. ඒ සඳහා මේ අවස්ථාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා.පසුගිය කාල සීමාව තුළදී අපි විශේෂ යෝජනා, වැඩසටහන් කෙරෙහි අපේ යෝජනා අදහස් ක්‍රියාත්මක කළා.ඒ සඳහා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මට බෙහෙවින්ම සහයෝගය

ලබා දුන්නා. ඒ වගේම අපිට නොයෙකුත් යම් යම් ආදායම් පිළිබඳව අපේ අවධානය යොමු කළා.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සාම්ප්‍රදායිකව තිබුණු ආදායම්වලට පරිබාහිරව නව ආදායම් මාර්ග හොයාගෙන, උත්පාදනය කරගෙන මේ සභාවේ ආදායම් මාර්ග වැඩි කිරීම සඳහා කටයුතු කළා. ඒ වගේම සාමාන්‍ය ජනතාවට පීඩාකාරී නොවන ආකාරයට බදු වැඩි කිරීම් වැනි ඒ ආදායම් රැස් කිරීමේ මාර්ග පිළිබඳව අපි සිතුවා.ඒවා ක්‍රියාත්මක කළා. ඒ වගේම පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මම සභාපතිවරයා වුණාට පස්සේ මේ සභාවේ කරන වියදම් අපි සීමා කළා.උදාහරණයක් විදියට සභාපතිවරයා විදියට පාවිච්චි කරන කැබ් රථයට මම අවම ඩීසල් ප්‍රමාණයක් විතරයි පාවිච්චි කරන්නේ.2021.07.13 සිට 2021.12.31 දක්වා අපිට ඩීසල් ලීටර් 693යි වැයවෙලා තියෙන්නේ.නමුත් ඊට පෙර ලීටර් 1451ක් වැය කරලා තියෙනවා. අපි ගමන් කරලා තියෙන්නේ කි.මී.2144යි.නමුත් අපේ හිටපු සභාපතිතුමා කලින් කි.මී.17152ක් ගමන් කරලා තියෙනවා. ඉතින් ඒ නිසා අපි වාහන භාවිතය අවම මට්ටමෙන් පාවිච්චි කරමින් ඒවා සුරක්ෂිතව අත්‍යවශ්‍ය කටයුතුවලට පමණක් යොදා ගත්තා. අපිට නොසිතූ විරූ පරිදි අපේ ඉන්ධන මිල වැඩිවුණා. එයත් අපට බලපෑවා.නමුත් අපි අරපිරිමැස්මෙන් තමයි වාහන පාවිච්චි කළේ. ඊට පෙර 2020.03.03 දා සිට 2020.12.26 දක්වා සුනිල් ජයවීර ගරු සභාපතිතුමා සිටි කාලේ ඩීසල් ලීටර් 4537ක් වැය කරලා තියෙනවා. අපි 2021.01.01 සිට 2021.02.28 දක්වා ලීටර් 1063යි. කි.මී.44800යි. කලින් 5600යි. ඉතින් මේ විදියට අපි වාහන භාවිතය අවම කරලා තියෙන්නේ.අපි මීට අමතරව ආණ්ඩුකාරතුමාගේ නියෝගය මැද අපේ සංවර්ධන කටයුතු රජයේ මැදිහත්වීමෙන් අවම කරන්න සිදුවුණා. ඒ නමුත් අපිට කරන්න පුළුවන් මට්ටමෙන් ඒ සංවර්ධන කටයුතු සහා කම්කරුවන් යොදාගෙන ස්වෙච්ඡා පදනමින් ඒ වගේම ස්වෙච්ඡා සංවිධානවල සහභාගිත්වයෙන් ඒ වගේම ගරු මන්ත්‍රීවරුන් ගේ හා කාර්යය මණ්ඩලයේ ශ්‍රම දායකත්වය මත යම් යම් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කළා.ඒ වගේම අපිට සභාවේ විශාල විදුලි බිලක් වැය වුණා. ඒ නිසා විදුලි හිඟයට විසඳුමක් ලෙසත් අපේ වියදම් අවම කර ගැනීම සඳහාත් ඒ වගේම විදුලි උත්පාදනය සඳහා වන වියදම් ඉතිරි කරගෙන අමතර ආදායමක් සභාවට ලබා ගැනීම සඳහාත් අපි සූර්යය කෝෂ විදුලි ධාරිතාවය ( solar power) සතිපොල තුළ නිර්මාණය කරන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා විදුලි නිෂ්පාදනය ඒකක 2300ක් අපට මාසිකව වැය වුණා. සතිපොල විදුලි පරිභෝජනයට ඒකක 904ක් යනවා. සතිපොල විදුලි බිල්පත් ගාස්තුව විතරක් මාසෙකට වැයවෙලා තියෙනවා රු.20896.00ක්. නියමිත ප්‍රමාණය අඩු කළාම අපිට විදුලි අතිරික්තයක් තියෙනවා ඒකක 1396ක් සූර්යය කෝෂ භාවිතය නිසා. වැඩිපුර විදුලි ජනනය මඟින් ලැබෙන විදුලි ආදායම 31410යි. වාර්ෂිකව අපිට ලැබෙනවා සූර්යය කෝෂ භාවිතය නිසා තුන්ලක්ෂ හැත්තෑහයදාස් නවසිය විස්සක්. අපි මෙය ව්‍යාපෘති වාර්තාවට ඇතුළත් කරලා කොමසාරිස්තුමාගේ අනුමැතියටත්, ආණ්ඩුකාරතුමාගේ අනුමැතියටත් ලබා දීලා අපට නොලැබුණ ආදායමක් සතිපොලට විදුලිය සූර්යය කෝෂ භාවිතයෙන් තුන් ලක්ෂ හැත්තෑහයදාස් නවසිය විස්සක ආදායමක් අපේ සභාවට උපයා ගන්න කටයුතු කරලා තියෙනවා.ඒ වගේම විවිධ භූ දර්ශන, උද්‍යාන තුළින් ආදායම් ලැබීමට අපි සියලුදෙනා එකතුවෙලා ඒ ගැන අවධානය යොමු කරලා තියෙනවා. ඒ නිසා අපි හෙට්ටිපොල නගරයේ බොහෝම සුන්දර ස්ථානයක් ලෙස සියඹලාගස්වැටිය වැව ප්‍රතිසංස්කරණය කරලා අලංකාර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මේ වනවිට අපි කටයුතු කරලා තියෙනවා.ඒ තුළින් අපි පරිසරය සුරක්ෂිත කිරීම, අලංකාරත්වය, නගරයට පිවිසෙන අයගේ සිත් ගන්නා ස්ථානයක් හැටියට සියඹලාගස්වැටිය වැව නිර්මාණය කිරීමට අපි කටයුතු කරලා තියෙනවා සුළු මුදලකින්.සුබසාධක සංගමයට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ප්‍රජා මණ්ඩලය අපට සහයෝගය දුන්නා. සියලුදෙනාගේම ශ්‍රම දායකත්වය මත අපි මේ ක්‍රියාව සිදු කළා.එමඟින් ආදායමක් ලබා ගැනීමට පැඩල් බෝට්ටු දෙකක් වැව තුළ ස්ථානගත කිරීමට කටයුතු කරලා තියෙනවා. පැඩල් බෝට්ටු සේවාවෙන් දවසකට ගමන්වාර 20ක් සිදු කිරීමටත් ඒ සඳහා රු.500.00ක පමණ ගාස්තු අය කිරීමකටත් ගමන්වාර 20 සඳහා අපිට දෛනිකව රු.10000.00ක් ආදායමක් ඉපයීමට කටයුතු කරලා තියෙනවා. ඒ වගේම මාසිකව දළ වශයෙන් රු.දෙලක්ෂ පනස්දාහක් ඒ ස්ථානයෙන් සභාවට මෙතෙක් නොලැබූ ආදායමක් ලබා ගැනීමට කටයුතු කරලා

තිබෙනවා.ඒ වගේම වාර්ෂික ආදායමෙන් රු.ලක්ෂ 30ක් මෙම ස්ථානයෙන් ලබා ගන්න කටයුතු කරලා තියෙනවා. මේවා සභාවේ නව ඉපයීම්, ආදායම් මාර්ග ලෙස ඔබතුමන්ලාගේ සහයෝගයෙන් අපි සිදු කර තිබෙනවා. ඒ වගේම අපිට තිබුණ බාධකත් සමඟ බොහෝ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න නොහැකි වුණත් සභාවේ අපි ශක්ති ප්‍රමාණයෙන් කටයුතු කරලා තියෙනවා. විශේෂයෙන්ම බණ්ඩාරකොස්වත්ත පානීය ජල ව්‍යාපෘතිය අක්‍රීය වීම නිසා නැතිනම් එම ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබා දීමට එම ජල මූලාශ්‍රය ප්‍රමාණවත් නොවූ බැවින් පඬුවස්නුවර ප්‍රාදේශීය සභා භූමියේ තිබෙන එම ළිදෙන් ජලය අරගෙන ඒ ජලය බවුසර් මාර්ගයෙන් බණ්ඩාරකොස්වත්තට ප්‍රවාහනය කිරීමට අපට විශාල මුදලක් දරන්න සිදුවුණා.දළ වශයෙන් එක්කෝටි විසිපන් ලක්ෂයකට වැඩි මුදලක් එක්කෝටි හැට ලක්ෂයක් විතර මේ සඳහා ට්‍රැක්ටර්වලට, ඩීසල්වලට, බවුසරයට, සේවකයින්ගේ වැටුප්වලට වැය කරන්න සිදු වුණා. අපි මේ සභාව භාර ගත්තාට පස්සේ ඉතාම කෙටි කාල පරිච්ඡේදයක් තුළ බණ්ඩාරකොස්වත්ත නගරයේ පානීය ජල හිඟයට පිළියමක් විදියට සතිපොල ආසන්නයේ වැව ආශ්‍රිතව ළිඳක් නිර්මාණය කරලා ඒ ළිඳේ ජලය අරගෙන පොම්ප කරලා අපි ලක්ෂ 40කට ආසන්න මුදලකින් ඒ ජල ව්‍යාපෘතිය නිම කරලා බණ්ඩාරකොස්වත්ත ජනතාවගේ සියලු ජල අවශ්‍යතාවයන්ට විසඳුම් ලබාදීමට හැකි වුණා.මම හිතනවා අපි සභාවක් විදියට පක්ෂ දේශපාලන භේදයෙන් තොරව කළ දේවල් වලට ජනතාවගේ ඇඟයීමට ලක්වෙනවා. ඒ වගේම කනෝගම ආශ්‍රිතව හරිත උද්‍යාන නිර්මාණය කළා. අපේ රටේ ජනතාව දැන් බහුලව බෝවෙන සහ බෝ නොවෙන රෝගවලට ගොදුරු වෙනවා. අපේ ප්‍රදේශයේ ඉන්න දුප්පත් ජනතාවට ආයුර්වේද සායන මධ්‍යස්ථානයක් අපේ සභාවේම පවත්වාගෙන යමින් තිබෙනවා. වෛද්‍යවරුන් හා කාර්යය මණ්ඩලය ඉන්නවා. ඒ නිසා ගමට ගිහින් ඒ ආයුර්වේද සායන පවත්වමින් අපි ජනතාවට ආයුර්වේද වෛද්‍ය පහසුකම් ලබාදෙන්න කටයුතු කරලා තියෙනවා. ඒ වගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හෙට්ටිපොල,පඬුවස්නුවර නැගෙනහිර කාර්යාල දෙකේ වෛද්‍යවරුන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කාර්යය මණ්ඩලය එකතුවෙලා අපි ඔබතුමන්ලාගේ කොට්ඨාශවලට ගිහින් ජංගම සායන මධ්‍යස්ථාන පවත්වලා ජනතාවට අවශ්‍ය පහසුකම් ලබාදීමට අපි මේ කාල සීමාව තුළ කටයුතු කළා. වෙනදාට වැඩිය ලොකු ප්‍රවණතාවක් මේ සඳහා ලැබිලා තිබුණා. ඒ වගේම පෙර පාසල් වැඩසටහන් අපි බොහෝම ක්‍රමානුකූලව පවත්වාගෙන යනවා. තිබුණ ප්‍රමාණයටත් වඩා වැඩියෙන් පෙර පාසල් වලට අනුග්‍රහය ලබා දුන්නා. ඒ වගේම පෙර පාසල් පාලිකාවන්ට විශේෂ පුහුණුවීම් ලබාදීලා ඔවුන්ට අවශ්‍ය පාඨමාලා හැදෑරීමට අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. දරුවන්ට ප්‍රායෝගික වැඩසටහන් කරනවා. උදාහරණයක් විදියට අපේ තක්ෂිලා පෙර පාසලේ දරුවන්ට සැන්දෑ කාලයේ අහස පිළිබඳව ප්‍රායෝගික වැඩසටහන් කළා. අපේ සභාවේ කාර්යය මණ්ඩලය හා පෙර පාසල්තුමියන්ලා එකතුවෙලා ඒ කටයුතු කරලා තිබෙනවා.ඒ වගේම පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපේ පුස්තකාල 07ක් තිබෙනවා. මේ පුස්තකාල 07 ඉතාම හොඳ මට්ටමේ තියෙනවා. විශේෂයෙන්ම ස්තූතිවන්තවෙනවා පුස්තකාලභාර නිලධාරීතුමියන්ලාට හා ඒවායේ සිටින කාර්යාල සහායකතුමියන්ලාට.ඔවුන් බොහෝම කැපවීමෙන් තමන්ගේ පුස්තකාල පරිශ්‍රයන් තුළ පාඨක සමාජ ඇති කරලා, ඒවාට සාමාජිකයන්, සිසුන් යොමු කරවලා විශාල වැඩ කොටසක් කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම ස්තූතිවන්තවෙනවා මේ අවස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන ලේකම් ගරු දයාසිරි ජයසේකර ගරු අමාත්‍යතුමා ක්‍රීඩා අමාත්‍යවරයා විදියට ඉන්න වෙලාවේ හෙට්ටිපොල ක්‍රීඩාංගනය නවීකරණය කරලා අංග සම්පූර්ණ ක්‍රීඩා පිටියක් බවට පත් කරලා පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට භාර දීලා තියෙනවා. ප්‍රාදේශීය සභාව පාලනය යටතේ ඒ ක්‍රීඩා පිටිය පිළිබඳව කටයුතු කරගෙන යනවා. ඒ වගේම මේ ප්‍රදේශයේ සිටින කලා කුසලතාවයන් තිබෙන කලාවට ලැදි දරුවන්ට රංගන කුසලතා හැකියාවන්, දක්ෂතාවයන් වැඩි දියුණු කරගන්න වැඩසටහන් පඬුවස්නුවර ආසනය තුළ පුස්තකාල පදනම් කරගෙන ක්‍රියාත්මක කරනවා. මේ සඳහා විශේෂයෙන්ම ජගත් කුමාර මහතාට මගේ ස්තූතිය පිරිනමනවා.පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව අගහිඟකම්, විවිධ අවහිරතා මැද්දේ වුණත් අපි ඉතා සාර්ථකව අංග සම්පූර්ණ පළාත් පාලන ආයතනයක් ලෙස වැඩ කරලා තිබෙනවා. මේ සියල්ල කිරීමට ඔබතුමන්ලාගේ සහයෝගය මට

උපරිම වශයෙන් ලැබුණා. පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරු එක් එක් පක්ෂවල ද කියලා හොයන්න බෑ. මොකද හැමෝම එක වගේ සුහදව ඔබතුමන්ලාව තෝරා පත්කළ ජනතාව වෙනුවෙන් දේශපාලන පක්ෂ භේදයකින් තොරව වැඩ කිරීම පිළිබඳව මම ගරු මන්ත්‍රී මණ්ඩලයට ගෞරවනීය ස්තූතිය පුද කරනවා. ඒ නිසයි මම කීවේ ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත්වන අවස්ථාවේ පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව ආදර්ශමත් ප්‍රාදේශීය සභාවක් බවට පත් කරනවා කියලා. ඒ කාර්යභාරය මම හොඳින් ඉටු කළා කියලා මම හිතනවා. ඔබතුමන්ලා එක්ක කිසිම පක්ෂ දේශපාලනයකින් තොරව ගම්වලට ගිහිල්ලා ගමේ ජනතාවට අවශ්‍ය දේ කරලා දෙන්න ඒ කොට්ඨාශ සියල්ලේම මන්ත්‍රීවරු සමඟ මම කටයුතු කරලා තියෙනවා.මුලදී මොන ප්‍රශ්න තිබුණත් අපි දැන් හොඳ එකඟතාවකට ඇවිත් තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා දෙපළක්වන චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි හා ඉන්දික ප්‍රදීප් රාජගුරු මහත්වරුන් බරපතල ප්‍රශ්නයකට මුහුණ දුන්නා. ඒ ප්‍රදේශයේ තිබුණ අත්‍යවශ්‍යම මාර්ගයක්, ජනයා වැඩිපුර ගමන් කරන මාර්ගයක් තිබුණා වාහනයක් පවා යන්න බැරිව අවහිරතාවයක. එම මන්ත්‍රීවරුන් දෙපළ කළ ඉල්ලීමට අනුව අපි දින 4-5ක් ඇතුළත අපිට පුළුවන් ආකාරයට සභාවේ යන්ත්‍රසූත්‍ර යොදවලා අපේ නිලධාරීන්ගෙන් තාක්ෂණික උපදෙස් ලබාගෙන ගමේ ජනතාවගේ ශ්‍රමදායකත්වය ලබාගෙන ඒ පාර හොඳ තත්වයෙන් හදලා දුන්නා.ඒ වගේම දිල්හානි ගරු මන්ත්‍රීතුමියගේ කොට්ඨාශයට අත්‍යවශ්‍ය බෝක්කු ආදිය ලබාදීමට ඇස්තමේන්තු සකස් කරලා කොමසාරිස්තුමාගේ අනුමැතියට ලබාදීලා තිබෙනවා.ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා,සමගි ජනබලවේගයේ ගරු මන්ත්‍රීතුමන්ලා /තුමියන්ලා, එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා, මුස්ලිම් කොංග්‍රසයේ ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම් අපි ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරලා තිබෙනවා. මම හිතනවා අද මුළු රටම බලාපොරොත්තු වෙන්නේ මේ වගේ දේශපාලන රටාවක්. අරගල භූමයේ සමහරු ඉල්ලුවේ මේ වගේ තත්ත්වයක්.පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව එයට ආදර්ශයක්. අපි නිර්පාක්ෂික මන්ත්‍රීවරු විදියට මෙතැනට ඇවිත්, මැතිවරණ කාලෙට තම දේශපාලන අනන්‍යතාවය ඉදිරිපත් කරලා තම දේශපාලන පක්ෂයේ වැඩ පිළිවෙල ඉදිරිපත් කරලා ජනතාවට කරන සේවය පිළිබඳව අවබෝධයක් ලබාදීලා ජනතාවට වැඩ කරන්න පක්ෂවලට ඡන්දය ලබා ගන්න කිසිම බාධාවක් මේ සභාව තුළ නැහැයි කියලා මම බොහොම ගෞරවයෙන් සිහිපත් කරනවා. දුෂ්කරතා තිබුණත්, අපිව අතහැරලා ගිය අය හිටියත්, නායකයෝ අපිව අමතක කළ තැන් තිබුණත් අපි පසුතැවෙන් නෑ. විශේෂයෙන්ම පොදුජන පෙරමුණේ අපේ ගරු මන්ත්‍රීවරු අපහසුතාවයට පත් වූ අවස්ථා තිබුණා. අපි බලපෑම් කළේ නෑ.නමුත් ඒ පිළිබඳව මම කණගාටු වෙනවා. මගේ කාර්යභාරය අයවැය ඉදිරිපත් කිරීම. ඒ සඳහා ඔබතුමන්ලාගේ සහයෝගය ලබාදෙන්න.

**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168-1 වගන්තිය යටතේ පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවට අදාලව 2023 වර්ෂය සඳහා සකස් කල අයවැය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය මේ අවස්ථාවේ මා විසින් මහා සභාවට ඉදිරිපත් කරනවා.**

# අයවැය -2023

## ගරු සභාපතිතුමාගේ අයවැය පණිවුඩය

**<u>ගරු උපසභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමියනි.</u>**

වයඹ පළාතට අයත් සත්කෝරළ අතුරින් සුවිශේෂී කෝරළ පහකින් සමන්විත ඓතිහාසික වශයෙන් පරිපූර්ණ පඩුවස්නුවර රාජධානිය වට කරගත් 109,284 පමණ ජනගහනයකින් හෙබි ග්‍රාම නිලධාරී වසම් 103 වපසරියක මහජන සේවයේ නියැලෙන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය ගරු සභාවේ උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය හා ජනතාවගේ දැනගැනීම පිණිසත්, සැලකිල්ලට යොමු වීම පිණිසත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පනවා ඇති ආඥා,අණපනත්,රීති හා ප්‍රඥප්ති මෙන්ම ප්‍රධාන වශයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් මා වෙත ලැබී ඇති බලතල අනුව මෙලෙස ඉදිරිපත් කරමි.

බාධක රැසක් මධ්‍යයේ වුවද 2022 වර්ෂයේ අයවැය අරමුණු සාක්ෂාත් කර ගනිමින් 2023 වර්ෂය සඳහා වූ අයවැය ඉදිරිපත් කරනු ලබන්නේ පසුගිය වර්ෂයේ මෙන්ම ඉදිරි කාලසීමාවන් සඳහා ද ඔබ සියළුදෙනාගේ සහයෝගය බලාපොරොත්තුවෙනි.

අයවැය ලේඛනය යනු පළාත් පාලන ආයතනයක ප්‍රධාන මූල්‍ය සැලැස්මයි. පාලිත ප්‍රදේශයේ ජනතාවගේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවාවන්ට හා පොදු මංමාවත් සංවර්ධනයට ද ඔවුනගේ සුබ විහරණය ,පහසුව, සුභ සාධනය හා සියළු පහසුකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමටද අදාළ වියයුතු කරුණු විධිමත් කිරීම , පාලනය කිරීම හා පරිපාලනය කිරීම ප්‍රධාන අභිලාෂය කොටගෙන මෙම මූල්‍යමය සැලැස්ම පිළියෙළ කොට ඇත. හුදෙක් අයවැය ලේඛනය යනු මූල්‍යමය සැලැස්මක් පමණක් නොව ජනතාවගේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන පිළියෙළ කරන ලද සංවර්ධන සැලැස්මයි.ජනතාවගේ හද ගැස්ම හඳුනාගෙන ඔවුනට අප විසින් ඉටු කළ යුතු භාරයක් සේ සලකා ජනතාවගේ හදවත් තුළ ජීවත් වෙමින් ඔවුනගේ අරමුණු හා අපේක්ෂාවන් ඉටුවන අයුරින් කටයුතු කළ යුතුය. එය අපගේ ඉදිරි දේශපාලන ගමන් මාර්ගය සවිබල ගැන්වීමට මහත් රුකුළක් වන බව මා මෙන්ම ඔබතුමන්ලාගේ ද හැඟීම බව මම විශ්වාස කරමි.

පසුගිය වර්ෂය දෙස ආපසු හැරී බැලීමේදී රටතුළ පැවති උද්ධමනකාරී තත්ත්වයන් හමුවේ දැඩි ආර්ථික අර්බුදයත් සමඟ වුවද පළාත් පාලන ආයතනයක් වශයෙන් අප ජනතාව අතරට සමීප විය. ප්‍රාදේශීය සභාව යටතේ වූ මාර්ග තාර දැමීම, කොන්ක්‍රීට් කිරීම, කුට්ටිගල් ඇල්ලීම හා බොරළු දමා සංවර්ධනය මෙන්ම මෝටර්ග්‍රේඩරය යොදා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම යම් මට්ටමකට සිදු කිරීමට හැකියාව ලැබුණි. එමගින් පඩුවස්නුවර පුරවරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කරමින් ජනතාවගේ ගමන් පහසුව ඇති කිරීමට කටයුතු කිරීම ඔවුනගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට ගන්නා ලද වැදගත් පියවරකි.

සංවර්ධන ක්‍රියාවලියේදී තිරසර සංවර්ධන අරමුණු යථාර්ථයක් බවට පත් කිරීම සඳහා සභාවට අයත් සියඹලාගස්වැටිය වැව භූදර්ශන ව්‍යාපෘතිය තවදුරටත් වැඩිදියුණු කරමින් බල ප්‍රදේශයේ පරිසර සුන්දරත්වයෙන් අනූන ස්ථානයක් ලෙස පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇති බව දන්වා සිටිමි. එසේම ක්‍රීඩා අමාත්‍යාංශ ප්‍රතිපාදන මත නවීකරණය කරන ලද හෙට්ටිපොල ක්‍රීඩාංගනය සභාව වෙත පවරා ගනිමින්

එහි දෛනික නඩත්තු කටයුතු ගුණාත්මකභාවයෙන් යුතුව යාවත්කාලීනව පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇති බව ද සතුටින් දැනුම් දෙමි.

සුභ සාධක සේවා යටතේ වෛද්‍යාධාර , අඩු ආදායම්ලාභී පවුල්වලට වැසිකිළි පහසුකම් ලබාදීම වැනි සේවාවන් ද ජංගම ආයුර්වේද වෛද්‍ය සායන මඟින් බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමට අත්වැලක් අප පළාත් පාලනය ආයතනය සැපයූ බව ප්‍රකාශ කර සිටිමි.

පසුගිය වකවානුව තුළ රට තුළ පැවති ඉන්ධන හා ගෑස් හිඟය මත අවට බල ප්‍රදේශයන්හි ආදාහනාගාර වසා තිබෙන අවස්ථාවේ පළාත් පාලන ආයතනයක් වශයෙන් පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කිරීම ජනතාවට මහත් පිටුවහලක් වූ බව සඳහන් කරමි.. බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය , පහසුකම් නැංවීම මෙන්ම එතුළින් විශාල ආදායමක් සභාව වෙත ලබා ගැනීමට හැකියාව ලද බව ද ඔබතුමන්ලා වෙත දන්වා සිටිමි. එසේ අඛණ්ඩව ආදාහනාගාරය වෙත ගෑස් නියමිත පරිදි සපයා දෛනික රාජකාරි පවත්වාගෙන යාම පිළිබඳ සභාවේ ලේකම්තුමා ඇතුළු අදාළ කාර්යමණ්ඩල හා සේවක මහතුන්ට නිලධාරින්ට බෙහෙවින්ම ස්තුතියිවන්ත වීමට ද මෙය අවස්ථාවක් කරගනිමි.

එසේම කනෝගම වැව ආසන්න හරිත උද්‍යානය පරිසරයක් නිර්මාණය කිරීම හා ඒ තුළින් ප්‍රදේශයේ ජනතාව ගේ මානසික සුවය හා පරිසර අලංකෘතභාවය පවත්වාගෙන යාමට අවස්ථාවක් උදාකර ඇති බවත්, එම ව්‍යාපෘතිය තවදුරටත් දියුණු කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටීමට කැමැත්තෙමි.

තවද 2022 වර්ෂයේ ප්‍රතිපාදන තුළින් සියඹලාගස්වැටිය වැව භූදර්ශන ව්‍යාපෘතිය හරහා පැඩල් බෝට්ටු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම හා ඒ තුළින් සභාවට නව ආදායම් මාර්ගයක් ඇති කිරීමට ද අපේක්ෂා කෙරේ.

නව වීථි පහන් සවිකිරීම හා නඩත්තුව බල ප්‍රදේශය පුරා කිසිදු පක්ෂ පාට භේදයකින් තොරව සැලසුම් සහගතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම මෙන්ම විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණක් වන්නේ 2022 ප්‍රතිපාදන මඟින් හෙට්ටිපොල සතිපොල භූමිය තුළ සූර්ය බල ශක්තිය මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතිය හරහා විදුලි ආලෝක ලබාගැනීම තුළින් සභාවට දැරීමට සිදුවන විදුලි බිල්පත අවම කර ගැනීමට අපේක්ෂා කිරීමයි.

මේ අයුරින් 2022 වර්ෂයේ කාර්යය භාරයන් පළාත් පාලන ආයතනයක් වශයෙන් ජනතාව වෙනුවෙන් සිදු කර ඇති අතර එමඟින් අප විසින් ජනතාව වෙත ඉටුකළයුතු ජනතා සේවාවන් වඩාත් ඵලදායීව ඉටු කර ගැනීමට හැකියාව ලැබූ බව මාගේ හැඟීමයි.

ගරු උපසභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමියනි.

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව 2022 වර්ෂය සේම 2023 වර්ෂයට ද ජනතාවගේ අභිලාෂයන් හඳුනාගෙන ඔවුනගේ අවශ්‍යතා හා වුවමනාවන් ඉටු කිරීමේ අරමුණ පෙරදැරිව මෙම වාර්ෂික අයවැය වාර්තාව සම්පාදනය කර ඇති බව දැනටමත් ඔබ දන්නා වූ කරුණකි. ඒ අනුව 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන අයවැය වාර්තාව අනුව පහත පරිදි ආදායම් වියදම් සාරාංශය මා විසින් ඉදිරිපත් කරමි.

| | |
|---|---|
| **2023 පුනරාවර්තන ආදායම් සාරාංශය** | |
| වරිපනම් හා බදු | රු. 4,287,000.00 |
| කුලී | රු. 28,164,497.00 |
| බලපත්‍ර ගාස්තු | රු. 1,550,500.00 |
| සේවා ගාස්තු | රු. 31,065,000.00 |
| වරෙන්තු ගාස්තු | රු. 18,255,000.00 |
| වෙනත් ආදායම් | රු. 8,965,000.00 |
| ආදායම් ආධාර | රු. 78,299,085.00 |
| **මුළු පුනරාවර්තන ආදායම** | **රු.170,586,082.00** |
| **2023 පුනරාවර්තන වියදම් සාරාංශය** | |
| වැටුප් හා දීමනා | රු. 93,759,975.00 |
| ගමන් වියදම් | රු. 1,074,000.00 |
| සැපයුම් හා උපකරණ | රු. 15,783,000.00 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | රු. 18,027,500.00 |
| ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක සේවා හා වෙනත් සේවා | රු. 13,571,000.00 |
| පොලී ගෙවීම්- ලාභාංශ හා ප්‍රසාද මුදල් | රු. 33,428.00 |
| ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | රු. 7,963,000.00 |
| විශ්‍රාම වැටුප් -විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | රු. 1,055,836.00 |
| **මුළු පුනරාවර්තන වියදම** | **රු.151,267,739.00** |
| **පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම** | **රු. 19,318,343.00** |
| **එකතු කළා - ප්‍රාග්ධන ආදායම හා ණය ලැබීම්** | **රු. 15,000,000.00** |
| **අඩු කළා - ප්‍රාග්ධන වියදම්** | **රු. 33,650,000.00** |
| **ණය ආපසු ගෙවීම්** | **රු. 667,424.00** |
| **අතිරික්තය** | **රු. 919.00** |

ඒ අනුව 2023 වර්ෂයට අදාළව උත්පාදිත ආදායම් තුළින් අපේක්ෂිත ආදායම් ද අනෙකුත් ආදායම් මූලාශ්‍ර මඟින් අපේක්ෂිත ආදායම් වැඩසටහන් අනුව පහත පරිදි ඉදිරිපත් කරමි.

| 2023 වැඩසටහන් අනුව ආදායම් සාරාංශය | |
|---|---|
| පොදු පරිපාලනය | රු. 50,226,200.00 |
| සෞඛ්‍ය සේවා | රු. 18,372,880.00 |
| භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | රු. 39,272,237.00 |
| ජල සේවය | රු. 7,207,360.00 |
| වෙනත් උපයෝගී සේවා | රු. 18,468,000.00 |
| සුභ සාධක සේවා | රු. 37,039,405.00 |

තවද 2023 වර්ෂයේ දී එක් එක් වැඩසටහන සඳහා පහත පරිදි පුනරාවර්තන වියදම් දැරීමට අපේක්ෂා කරමි.

| 2023 වැඩසටහන් අනුව වියදම් සාරාංශය | |
|---|---|
| පොදු පරිපාලනය | රු. 24,205,543.00 |
| සෞඛ්‍ය සේවා | රු. 28,065,013.00 |
| භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | රු. 35,794,928.00 |
| ජල සේවය | රු. 8,987,860.00 |
| වෙනත් උපයෝගී සේවා | රු. 6,457,740.00 |
| සුභ සාධක සේවා | රු. 47,756,655.00 |

එසේම 2023 වර්ෂයේ අපේක්ෂිත ප්‍රාග්ධන ආදායම රු. 15,000,000.00 වන අතර අපේක්ෂිත ප්‍රාග්ධන වියදම රු.33,650,000.00 ක් බව සඳහන් කරමි.

එළඹෙන 2023 වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කරනු ලබන්නේ රට තුළ පවතින ආර්ථික අර්බුද හමුවේය. පළාත් පාලන ආයතනයක් වශයෙන් ගත් කල මෙම ආර්ථික අර්බුදය බල ප්‍රදේශයේ ජනතාව වෙත දැඩි සේ බලපාන බැවින් එම තත්ත්වයන් මත අද වනවිට අපගේ ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ග රැසක් අවහිර වී ඇත. නමුත් ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු අවශ්‍යතා පුළුල් වී ඇත. මෙම අභියෝගාත්මක තත්ත්වය හමුවේ සියළු දෙනාගේ සහයෝගය මත පළාත් පාලන ආයතනයක් වශයෙන් 2023 වර්ෂයේ අරමුණු ඉටු කර ගැනීමට හැකිවෙතැයි අපේක්ෂා කරමි.

පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක ජනතාවගේ අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා පවත්නා මූල්‍ය, භෞතික හා මානව සම්පත් සීමිත වුවත් එම සම්පත් උපරිම උපයෝජනයක් සහිතව මෙන්ම තිරසර සංවර්ධන අභිමතාර්ථ අනුව ජනතා සහයෝගය උපරිම අයුරින් ලබාගන්නා වැඩසටහන් වලට මූලිකත්වය ලබාදී කටයුතු කිරීම තුළින් ජනතාවගේ අවශ්‍යතා රැසක් ඉටු කරගැනීමට හැකියාව පවතින බව මාගේ හැඟීමයි.

රටතුළ පවතින ආර්ථික අර්බුදය හමුවේ නඩත්තු සේවා කටයුතු වෙනුවෙන් 2023 වර්ෂය තුළ පෙර වර්ෂයන්ට සාපේක්ෂව ප්‍රතිපාදන වැඩි වශයෙන් වෙන් කිරීමට සිදු වුවුද ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් අත්‍යවශ්‍ය වැඩසටහන් ක්‍රියාවට නැංවීම අමතක කර නොමැති බව සඳහන් කරමි. ඒ අනුව හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමය ජාතික ජල සම්පාදන මණ්ඩලයට පවරා ගැනීම තුළින් නගරයේ ප්‍රධාන සේවා සපයන ස්ථාන සඳහා දැරීමට සිදුවන ජල බිල්පත් ගාස්තුව අවම කිරීමේ අරමුණින් හෙට්ටිපොල බස්නැවතුම්පලට සහ හෙට්ටිපොල සතිපොල සඳහා නල ලිං දෙකක් ඉදි කිරීමට යෝජිතය. එසේම මාර්ග සංවර්ධනය පුළුල් කිරීම සඳහා තාර දැමූ මාර්ග නඩත්තුව මෙන් ම පක්ෂ භේදයකින් තොරව සියළු කොට්ඨාශයන් සඳහා මෝටර් ග්‍රේඩර් යොදා මාර්ග නඩත්තුව වෙනුවෙන් පෙර වර්ෂයන්ට සාපේක්ෂව වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇති බව දන්වා සිටිමි.

තවද ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා ජංගම ආයුර්වේද සායනද වැඩසටහන් වැඩි කිරීමට ද අපේක්ෂා කරමි.

ඉන්ධන හා ගෑස් මිල ඉහළ අගයක් ගැනීම හේතුවෙන් 2022 වර්ෂයේ දී සංශෝධනය කරන ලද ආදාහනාගාර ගාස්තු හේතුවෙන් 2023 වර්ෂය තුළ පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ ආදායමක් අපේක්ෂා කරනු ලැබේ. එසේම නවීකරණය කරන ලද හෙට්ටිපොල ක්‍රීඩා පිටිය තුළින් හා සියඹලාගස්වැටිය වැවෙහි පැඩල් බෝට්ටු ව්‍යාපෘතිය තුළින්ද සමස්ථ ආදායමට ඉහළ දායකත්වයක් ඉදිරියේදී ලබාගැනීමට අපේක්ෂා කරමි.

සමස්ථයක් වශයෙන් ගත් කළ පෙර වර්ෂයන්ට සාපේක්ෂව ආදායම් මාර්ග ඇහිරී තුබුනද බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය වෙනුවෙන් අවධානය යොමු කර 2023 වර්ෂය සඳහා තුලනාත්මක අයවැයක් ඉදිරිපත් කර ඇති බව දන්වා සිටිමි. ඒ සඳහා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පරිපාලන නිලධාරියා වන ලේකම්තුමා ඇතුළුව සියළුම නිලධාරී මණ්ඩලයද අනෙකුත් සේවක මහත්ම මහත්මීන් ද විශාල සහයෝගයක් ලබාදෙන අතර එම සහයෝගය ඉදිරියටත් අපේක්ෂා කරමි.

ගරු උපසභාපතිතුමා ඇතුළු මගේ සහෝදර මන්ත්‍රී මණ්ඩලයෙන් හා ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයෙන් ලද සහයෝගය මත පෙර වර්ෂයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලද බවත් ඒ

සම්බන්ධයෙන් මාගේ ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් දන්වා සිටිමි. එසේම ජනතාවගේ අපේක්ෂා ඉටු කිරීම සඳහා එම සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වන බව දන්වා සිටිමි.

ප්‍රධාන ලෙසම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා , ගරු අගමැති දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු ගරු අමාත්‍යතුමන්ලා හා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාන්ලාගෙන් පඬුවස්නුවර පුරවරයේ සංවර්ධනය හා ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කර දීමට සහයෝගය මෙම අයවැය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගෞරවාන්විතව අපේක්ෂා කරමි.

පඬුවස්නුවර ජනතාවගේ සිතුම් පැතුම් ඉටු කර දීම සඳහා පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ ඔබ තමුන්නාන්සේලාගේ සහයෝගය ද ගෞරවයෙන් අපේක්ෂා කරමි.

අවසාන වශයෙන් වයඹ ආණ්ඩුකාරවරතුමා, වයඹ ප්‍රධාන ලේකම්තුමා වයඹ ප්‍රධාන අමාත්‍යංශ ලේකම්තුමා, පළාත් පාලන කොමසාරිස්තුමා සහ සහකාර කොමසාරිස්තුමන්ලා ඇතුළු කාර්යය මණ්ඩලය ඉතා කෘතවේදීත්වයෙන් සිහිපත් කරමි.

එමෙන්ම මෙම සියළු කාර්යය වලදී මා හට ශක්තියක් වන ප්‍රාදේශීය සභාවේ ගරු උපසභාපතිතුමා , ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් මෙන්ම ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලය ද මා නැවතත් කෘතවේදීව සිහිපත් කරමින් 2023 වර්ෂය සඳහා වූ අයවැය පණිවුඩය මෙසේ නිමා කරමි.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168-1 වගන්තිය යටතේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අදාලව 2023 වර්ෂය සඳහා සකස් කල අයවැය පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

මීළහට අයවැය සඳහා වයඹ පළාත් ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමා විසින් 2020 ඔක්තෝබර් 28 දාතමින් ඉදිරිපත් කර ඇති 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති මාලාවේ අංක 11.(1) රීතිය යටතේ සංශෝධන ඉදිරිපත් කර නැත.

විශේෂයෙන්ම දයාසිරි ජයසේකර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු ලේකම්තුමාටත්, සමගි ජනබලවේගය නියෝජනය කරන තුෂාර ඉඳුනිල් ගරු මන්ත්‍රීතුමාටත් මගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිනවා. එක්සත් ජාතික පක්ෂ සංවිධායකතුමන්ලා මට සභාවේ කටයුතු කරගෙන යාමට උපරිම සහයෝගය ලබාදුන්නා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගරු මන්ත්‍රීවරු මට සහයෝගය ලබා දුන්නා.සියලු දෙනාටම ස්තුතිය පුද කරමින් එක පක්ෂයක එක මන්ත්‍රීවරයෙක් වශයෙන් අයවැය සම්බන්ධ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමා අද ඉදිරිපත් කළේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ දෙවැනි අයවැය.අපි සතුටු වෙනවා ඔබතුමාගේ අයවැයේදී හොඳ යෝජනා කිහිපක්ම ඉදිරිපත් කරලා තිබුණා. ඒවායෙන් කීපයක්ම සංවර්ධන කටයුතු යෝජනා.අපි පක්ෂයක් විදියට අපි සතුටු වෙනවා ඔබතුමා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට 2023 වර්ෂයේ අයවැය ඉදිරිපත් කිරීම පිළිබඳව.ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු 07දෙනා ගේ සුභාෂිංසනය මේ අවස්ථාවේදී පුද කරනවා.ඒ වගේම ඔබතුමා අයවැය ඉදිරිපත් කරනවිට කියා සිටියා සතිපොලේ solar පද්ධතිය හරහා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට එන ආදායම කොතෙක්ද කියලා. අපි සතුටු වෙනවා මෙතෙක් නොලැබූ ආදායම්, අහිමි වූ ආදායම් ඔබතුමාගේ නායකත්වයෙන් ලබා ගැනීම සම්බන්ධව.2022 වසරේ ගෙන ආව යෝජනාවල ප්‍රතිලාභ 2023 වසරේ ලබා ගැනීමට හැකිවෙයි. අලුත් යෝජනා නිර්මාණය කරලා පඩුවස්නුවර ආසනයේ ජනතාවට ප්‍රතිලාභ ගෙනෙන්නට අවස්ථාව සැලසූ ඔබතුමාට අපේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. ඒ වගේම ලේකම් මහතාටත් ස්තූතිය පුද කරනවා. පුස්තකාලය ඉදිරිපිට වැවේ පැඩල් බෝට්ටු දාලා එයිනුත් යම් ආදායමක් උත්පාදනය කළ හැකි බව කීවා. මම හිතන විදියට අවුරුද්දකට ලක්ෂ 30ක පමණ ආදායමක් ගන්න පුළුවන් වෙයි.අපි සතුටු වෙනවා ඔබතුමාත්, ලේකම්තුමාත්, කාර්යමණ්ඩලය හා අපේ සහෝදර මන්ත්‍රීවරු සමඟ එකතුවෙලා ඒ වැව අලංකාර කරන්නට පසුගිය වකවානුවේදී තම තමන්ට හැකි විදියට මුදල් වියදම් කළා. ශ්‍රමයෙන් දායකත්වය දුන්නා.අද පඩුවස්නුවර පුරවරයේ ජනතාවට යම් ප්‍රතිලාභයක් ගෙනදීමට හැකි වීම පිළිබඳව සියලුදෙනාටම මගේ ස්තූතිය පුද කරනවා. ඒ වගේම ඔබතුමා ප්‍රකාශ කළා හෙට්ටිපොල ක්‍රීඩාංගනය තිබුණ විදිය පිළිබඳව.ඒ සම්බන්ධව පසුගිය සභාවලදී නොයෙකුත් විවේචන ආවා. අපහාස චෝදනා ආවා. නමුත් ඒවාට නොසැලී දයාසිරි ජයසේකර මහතා ගේ නායකත්වයෙන් ක්‍රීඩාංගනය නවීකරණය කරලා අද පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට පවරාගෙන තිබෙනවා.අපේ කම්කරුවන් එය නඩත්තු කරගෙන යනවා. අද ක්‍රීඩාංගනය තුළිනුත් අපේ ප්‍රාදේශීය සභාවට මුදල් උපයා ගන්න හැකිවෙලා තිබෙනවා. ඔබතුමා ප්‍රකාශ කළා කොරෝනා වසංගත කාලේදී ආදහන කටයුතු කරන්න අපහසු තත්වයක් තිබෙද්දී පඩුවස්නුවර ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ සියලු කටයුතු කරන්න අදාල නිලධාරීන් කැපවීමෙන් කටයුතු කළා. ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් සපයාගෙන පඩුවස්නුවර ආසනයේ ජනතාවට පමණක් නෙවෙයි කුලියාපිටිය, බිංගිරිය,නිකවැරටිය,කොබෙයිගනේ ආදී ප්‍රදේශවල ජනතාවටත් සේවය ලබාදීමට හැකිවීම සම්බන්ධව මගේ ස්තූතිය පුද කරනවා. අපිට කරන්න පුළුවන්දේ අපි කරමු. 2023 වර්ෂයට හොඳ අයවැයක් ඉදිරිපත් කළා කියලා හිතනවා.ඉදිරියේදී වර්ෂාවත් සමඟ මංමාවත්වල නඩත්තුව සඳහා වැඩි අවධානයක් යොමු කර තිබීම සතුටට කරුණක්. පක්ෂ පාට භේදයකින් තොරව ගරු මන්ත්‍රීවරු ඔබතුමාගේ වැඩපිළිවෙළ හරියට කරගෙන යාමට සහයෝගය දීමට පැමිණ සිටිනවා. එදා ඔබතුමා සභාපතිවරයා ලෙස තෝරාගන්නවාට විරුද්ධ වූ මන්ත්‍රීවරු අද ඔබතුමාගේ වැඩ පිළිවෙල තේරුම් අරන් ඉන්නවා. ඒ පිළිබඳව සතුටු වෙනවා වගේම සියලුම මන්ත්‍රීවරුන්ට ස්තූතිය පුද කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (පො.ජ.පෙ.)</u>**

ඉතාම සංතෝෂයි.අපි ප්‍රාදේශීය සභාවට පත්වෙලා දැන් අවුරුදු 10ක් විතර වෙනවා. ඒ වකවානුවේ මතභේද ගොඩක් එක්ක තමා අපි ගමනක් ගියේ. ඒක වැරදියි. පක්ෂයක් පාටක් කුමක් වුණත්, මේ කවුරු සභාපති වුණත් කමක් නෑ කියන තැන ඉඳන් අපට වැඩ කරන්න පුළුවන්නම් එයයි විය යුතුදේ.වීදි පහන් වැඩසටහන ගත්තාම අපට ගම්වල මිනිසුන්ගෙන් බැණුම් අහන් නැතුව වැඩ කරන්න හොඳ වැඩ පිළිවෙලක් හදලා තිබුණා. මෝටර්ග්‍රේඩරය දෙන්න පුළුවන් අවස්ථාවල ලබාදීලා අපට මිනිසුන්ට වැඩ කරන්න ක්‍රමවේද හදලා දුන්නා.අපි විපක්ෂයේ අයට සැලකුවේ නැත්නම් එය මෝඩ ක්‍රියාවක්. මොන පක්ෂයෙන් සභාපති වුණත් කොට්ඨාශයේ මන්ත්‍රීවරයා කවුරු වුණත් මෝටර්ග්‍රේඩරය ලබාදෙන් නැත්නම්, වීදි පහන් හදලා දෙන් නැත්නම් සභාපතිවරයාගේ මෝඩ ක්‍රියාවක්. කවුරු වුණත් මිනිස්සු. තම පක්ෂයේ මන්ත්‍රීවරයෙක්ම විය යුතු නෑ. එය නොසලකා හැර ජනතාවට සේවය කළ යුතුයි.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව ආදර්ශමත් ප්‍රාදේශීය සභාවක් ලෙස දක්වන්න පුළුවන්. මොකද සියලු මන්ත්‍රීවරුන්ට එක හා සමාන ලෙස සලකන මන්ත්‍රීවරුන්ගේ ගෞරවය රැකදෙන ආයතනයක්. සියලුදෙනාම සභාපතිතුමාගේ කටයුතුවලට සහයෝගය ලබාදෙන්නැයි ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

නව සභාපතිවරයාගේ දෙවැනි අයවැයයි මේ. පළමු අයවැය විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් තමයි සම්මත වුණේ. අපි සභාපතිවරයා පත්කර ගනිද්දී විශේෂ කාර්යභාරයක් ඉටු කළ අයෙක් විදියට ශ්‍රී ලංකා

නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු විසින් බොහෝම අමාරුවෙන් ඔබතුමාව පත් කළා. ඔබතුමා බලාපොරොත්තු වූ දේ තමා අපිත් බලාපොරොත්තුවෙන්නේ.අපිත් පෙරදී වධ වේදනා වින්දා මේ සභාවට ඇවිල්ලා.අවුරුදු 3ක් අපටත් අල්පෙනෙත්තක තරම් දෙයක්වත් ලැබුණේ නෑ. ඒ නිසා අපේ ප්‍රතිඵල සියලුදෙනාම භුක්ති විඳිනවා කියලා දැන ගැනීමත් සතුටට කරුණක්. අපි මේ සභාපතිවරයාගෙන් බලාපොරොත්තුවෙන්නේ වංචාව දූෂණය පිටු දැකලා සංවර්ධන කටයුතු සිදු කිරීමයි.අපි බලාපොරොත්තු වූ දේ ලැබෙනවානම් මේ අයවැයේදී අපිට සතුටු වෙන්න පුළුවන්. නමුත් කාලයක් තිස්සේ මන්ත්‍රීවරුන්ට ලැබුණ ප්‍රතිපාදන රටේ තිබුණ තත්වයත් සමඟ යම් යම් කාරණා සම්බන්ධව මේ අයවැයේදී දැක්කේ නෑ. නමුත් ඒ ගැන මම කණගාටු වෙන්නේ නෑ.මහජන ඡන්දයෙන් පත්වුණ මන්ත්‍රීවරුන්ට විශේෂ වරප්‍රසාද නොලැබුණත් පොදුවේ සියලුම මන්ත්‍රීවරුන්ට ඔබතුමා අවධානය යොමු කරන්න. අයවැය ට විරුද්ධව කවුරුත් සංශෝධන ඉදිරිපත් කරලා නෑ කීවා. එසේනම් මේ අයවැයට සියලුදෙනා එකඟයි කියන කාරණය පැහැදිලියි. මම විශ්වාස කරනවා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු විදියට මේ අයවැයේදී දකින්නට තරම් අඩුපාඩුවක් නැහැ. අපි බලාපොරොත්තු වෙනවා මේ සියල්ලම කරන්න නොහැකි වුණත් 2023 වර්ෂයේදී ඔබතුමාට සංවර්ධන කාරණා ඉටු කිරීමට සියලුදෙනාම සහයෝගය ලබාදෙයි කියලා. 2023 වර්ෂයට ඉදිරිපත් කළ අයවැයට මම සුබ පතනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය - (එ.ජා.ප.)</u>**

2023 වර්ෂය සඳහා අයවැය අද ඉදිරිපත් කරලා තිබෙනවා.එදා සභාපතිවරයා විදියට ඔබතුමාව පත් කිරීමේදී තැබූ විශ්වාසය ඒ විදියටම රැක ගනිමින් සියලුමදෙනාට එක වගේ සලකමින් මන්ත්‍රීවරුන්ගේ ගෞරවය රැක ගනිමින් ඔබතුමා කටයුතු කිරීම පිළිබඳවත් හදවතින්ම සතුටුවෙනවා.ඒ අනුව 2023 වර්ෂයේ අයවැය යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමට හැකිවෙන්න කියලා ඔබතුමාට ප්‍රාර්ථනා කරමින් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මම සුබ පතනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා - (ශ්‍රී ලං.මු.කො.)</u>**

මම අද ගරු සභාපතිතුමාගේ දෙවැනි අයවැයට සම්බන්ධවෙන්නේ. ඇත්තවශයෙන්ම මේ අයවැයත් පිළිගැනීමට හැකි අයවැයක් ලෙස මම හිතනවා. ගරු සභාපතිතුමා බණ්ඩාරකොස්වත්ත වෙන්දේසියට ඉමහත් සේවයක් කර තිබුණා.ලක්ෂ 40ක් පමණ වැය කරලා අපේ බණ්ඩාරකොස්වත්ත නගරයේ පානීය ජල ව්‍යාපෘතිය හේතුකොටගෙන මෙම භූමියේ සිට දවසකට වතුර බවුසර් 10ක් පමණ ගෙනගිය අවස්ථා තිබුණා.මේ ගරු සභාපතිතුමා පත්වීමෙන් අනතුරුව දේශප්‍රිය ගරු මන්ත්‍රීතුමා හා මම එකතුවී පානීය ජලය සම්බන්ධව බණ්ඩාරකොස්වත්ත මහා වැවේ ඉස්මත්තේ ලිඳක් කපන්න අදහස ලබා දුන්නා.ලේකම්තුමා හා කාර්යමණ්ඩලය එකතුවී පානීය ජල ලිඳ නිර්මාණය කරලා මෝටර් සවි කර දීම නිසා තමා අද බණ්ඩාරකොස්වත්තට පිරිසිදු පානීය ජලය ලැබෙන්නේ.එයට ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම මේ ජනවාරි මාසේ සිට මෙතෙක් පඩුවස්නුවර ආසනයටම ඉමහත් සේවයක් කරලා තිබෙනවා. හොඳ තත්වයේ වීදි ලාම්පු සවි කරලා ඒවා අලුත්වැඩියා කිරීම පිළිවෙළකට සිදු කරනවා.ඒ වගේම මට මෝටර්ග්‍රේඩරයත් ලබා දීලා තිබෙනවා කිහිපවතාවක්ම.ඒ වගේම JCB යන්ත්‍රය පවා ලබා දීලා තිබෙනවා.ඔබතුමාගේ අයවැය කීව විදියටම කරාවී කියලා මම විශ්වාස කරනවා. ගිය අවුරුද්දෙත් මම ඔබතුමාගේ අයවැයට ඡන්දය ලබා දුන්නා.මෙවරත් මම ඡන්දය ලබාදෙනවා වගේම ඔබතුමාට සුබ පතනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

2023 අයවැය ඉදිරිපත් කරන මේ මොහොතේ මගේ අදහස් දක්වන්න සූදානම්වෙන්නේ.ඇත්තටම ප්‍රාදේශීය සභාවේ නිල කාලය ඉවරවෙන්නේ අවුරුද්දකින් දීර්ඝ කළ නිසා ලබන පෙබරවාරි මාසේ.ඊට පසුව මැතිවරණයකට අපට යන්න වෙනවා. එහෙම නොවුණොත් 1987 පළාත් පාලන පනතට අනුව කොමසාරිස්වරයාගේ අණට යටත්වෙනවා.ඒ නිසා 2023 අයවැය මැතිවරණයක් තිබ්බොත් එයින් බලයට පත්වෙන පාර්ශවය ඉදිරියට පවත්වාගෙන යායුතුයි.එසේ නැත්නම් කොමසාරිස්වරයෙකු පාලනය කළොත් ඔහුටත් අවශ්‍යවෙනවා අයවැයක්.මිනිස් බල සාරාංශය කොටසේ පුස්තකාලයාධිපතිවරු බිංදුවක් ලෙස තමා සඳහන් වෙන්නේ. මුද්‍රණ දෝෂයක්ද දන්නේ නෑ. ගරු සභාපතිතුමනි, පුස්තකාලයාධිපතිවරු බිංදුවයි. එය වැරදීමක්ද?

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරු මන්ත්‍රීතුමා, මේ රීතිවලට අනුව රැස්වීම පැවැත්වීමට වැඩ කරන දින තුනකට කලින් සංශෝධන ඉදිරිපත් කරන්න ඕනා. ඒ නිසා දැන් සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්කමක් නෑ. සංශෝධන නොමැති වාර්තාවක් විදියටයි මෙය මම ඉදිරිපත් කළේ.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)**

ගරු සභාපතිතුමනි, මේ අයවැය ලේඛනය තුළ 2023 වර්ෂයට අපේක්ෂිත මුළු ආදායම ලක්ෂ එක්දාස් අටසිය පනස්පහයි. අටදාස් හයසිය අසූදෙකක් වෙනවා.ඒ වගේම පුනරාවර්ථන වියදම් එකතු වෙනවා මෙය පවත්වගෙන යන්න. පරිපාලන වියදම්, නඩත්තු වියදම් එකතුවෙලා ලක්ෂ එක්දාස් පන්සිය දොළහයි. හැටහත්දාස් හත්සිය තිස් නවයක්.ප්‍රාග්ධන වියදම් ලෙස ලක්ෂ තුන්සිය තිස් හයයි පනස්දාහක්. ගරු සභාපතිතුමනි, මේ අයවැයේ අපි බලාපොරොත්තුවෙන ව්‍යුහාත්මක වෙනසක් නෑ.ඒ ව්‍යුහාත්මක වෙනස තමයි අපි බලාපොරොත්තුවෙනවා වියදම් අඩුකළ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය.පහුගිය අයවැය වල තත්වයට වඩා වෙනසක් නෑ සංවර්ධනය අපේක්ෂා කරන්න.මන්ත්‍රීවරු ගම්වලට ගිහින් කියන්නේ පාරවල් හදනවා, බෝක්කු දානවා, පාලම් හදනවා කියලා. ඒත් මංමාවත්වලට ලක්ෂ හතරක මුදලක් වෙන්වෙලා තිබෙන්නේ.ඒ නිසා මේ කියන සුන්දර කතා සිහින බලාපොරොත්තු ඉටු කළ නොහැකි අයවැයක් බවට පත්වෙලා තිබෙන්නේ.ඉතිහාසය පුරාම සිදුවුණේ ඒ දේ තමා.ඉතින් අපි බලාපොරොත්තු වෙන ව්‍යුහාත්මක වෙනස මීට වඩා වෙනස් පරිවර්ථනයක්.මම මෙයට සංශෝධන ඉදිරිපත් කළානම් මේ අයවැය සහ මුලින්ම වෙනස් කරන්න සිදුවෙනවා.ඒ නිසා මම සංශෝධන ඉදිරිපත් කළේ නෑ. ඉතින් අපි බලාපොරොත්තු වෙන ව්‍යුහාත්මක වෙනසක් නැති නිසා මම මේ අයවැයට විරුද්ධයි.මීළඟ ඡන්දයේදී ජනතාව ප්‍රතිඵල ලබාදෙයි.කෙසේවෙතත් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව දැන් අවුරුදු 5කට ආසන්න ප්‍රමාණයක සිට ව්‍යුහාත්මක වෙනසක් වෙලා නෑ.සංසන්දනාත්මක වෙනසක් වෙලා ඇති.නමුත් අපේ බලාපොරොත්තුව සංසන්දනාත්මක වෙනසක් නෙවෙයි ව්‍යුහාත්මක වෙනසයි.ඒ වෙනස ජනතාවට දැනිය යුතුයි.2023 වසර සුබ නව වසරක් වෙන්න අවශ්‍ය කරන ඥානය පහළ වේවා.මේ මන්ත්‍රීවරු දෙවිදියකට හිතනවා.එක කොටසක් හිතනවා මගේ ප්‍රදේශය සංවර්ධනය කරන්න ඕනා.ඒ නිසා මම කැපවීමෙන් වැඩ කරනවා.එයින් මම සත පහක දෙයක් බලාපොරොත්තු වෙන් නෑ. තව කොටසක් හිතනවා පාරක් හදා ගත්තොත් ගමටත් හොඳයි.සාක්කුවටත් හොඳයි කියලා සතුටුවෙනවා. 2023 වසරවත් හොඳ වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ස්තුති ගරු මන්ත්‍රීතුමා.ඔබතුමා ව්‍යුහාත්මක වෙනසක් කරන්න කලින් මේ ප්‍රාදේශීය සභාවෙන් දෙන වීදි පහනවත් ඔබතුමාගේ කොට්ඨාසයේ අහිංසක මිනිසුන්ටවත් ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරනවා. තව කවුරුහරි ඉන්නවා නම් අදහස් ඉදිරිපත් කරන්න දෙන්නම්.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)**

විශේෂයෙන් අද මේ තියෙන්නේ අප සභාවේ වර්ථමාන සභාපතිතුමාගේ දෙවැනි අයවැයයි ඉදිරිපත් කරන්නේ. ගරු මන්ත්‍රීතුමන්ලා සියළු පක්ෂ නියෝජනය කරමින් අද අයවැය සම්බන්ධ පක්ෂව හා ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා විපක්ෂව අදහස් ප්‍රකාශ කලා. මේ අයවැය සම්බන්ධයෙන් අපි විශේෂයෙන් සතුටු වෙනවා ගරු සභාපතිතුමා පත්වෙලා දෙවනි අයවැය ඉදිරිපත් කරන විට විශේෂ වැඩසටහන් රැසක් පැවැත්වූ බව මේ අයවැය තුල සඳහන් වුනා.ගරු සභාපති තුමනි අපි පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු ලෙස බලාපොරොත්තු වෙන්නේ සංවර්ධන කටයුතු වලට අපිට ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳවයි.අපිට වැඩ කරන්න වෙලා තියෙන්නේ රටේ පවතින අර්බුධකාරී තත්ත්වයත් එක්ක.කාලෝචිත යෝජනා කීපයක්ම ඉදිරිපත් කළා. විශේෂයෙන් ම අපි පහුගිය කාලේ සියඹලාගස්වැවේ ශ්‍රමදානයක් යොදා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීමණ්ඩලය සභාවේ මුදල් වියදම් නොකර ඒ වැව සංවර්ධනය කරා. ඉතින් 2023 වසරේදී අපි සියලුදෙනාගේ බලාපොරොත්තුව වන්නේ ඒ වැවේ පැඩ්ල් බෝට්ටු යොදා ව්‍යාපෘතියක් ආරම්භ කරලා සභාවට ලොකු ආදායමක් ගන්න පුළුවන්. මේ පිළිබඳ අවධානය යොමුකිරීම සම්බන්ධ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගෞරවනීය ස්තුතිය පුදකරනවා. තවද විශේෂයෙන් අපේ පක්ෂයේ නායකයා වන ගරු දයාසිරි ජයසේකර මැතිතුමන්ගේ බලාපොරොත්තු වූයේ හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කර අපේ ප්‍රදේශයේ දරු දැරියන්ට මේ

ක්‍රීඩාංගනය තුලින් ජාතික තලයට අපේ ගමින් ක්‍රීඩකයෝ බිහිකරන්න. නමුත් පසුගිය කාලයේ තිබුණු දේශපාලන අස්ථාවරත්වය නිසා හිතපු ආකාරයෙන්ම ඒ කටයුතු සිදුකරන්න නොහැකි වුනා. නමුත් හෙට්ටිපොල නගරය ආසන්නයේ තියන නගරවල තිබෙන ක්‍රීඩාංගන ගත්කල හෙට්ටිපොල ක්‍රීඩාංගනය සතුටු හිතෙන ආකාරයේ ක්‍රීඩාංගනයක් කිරීමට හැකි වුනා. අද වන විට පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට ලොකු ආදායමක් එන ආකාරයට මේ ක්‍රීඩාංගනය සකස් කරලා පවරලා දුන්නා. ඉදිරියේදී මේ ක්‍රීඩාංගනය තුලින් අපිට ලොකු ආදායමක් ගලාගෙන එන්න පුළුවන්. තවද විශේෂයෙන් ගරු සභාපතිතුමා වීදිපහන් සඳහා සැලසුමක් හදලා තියනවා.තවද මෝටර්ග්‍රේඩරය ද පක්ෂ භේදයකින් තොරව ඔබතුමා හැමෝටම ලබාදුන්නා. ඉතින් අපේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. අද ඔබතුමාට සතුටුවෙන්න පුළුවන් ඔබතුමාගේ වැඩපිලිවෙල නිසා සෑම පක්ෂයකම මන්ත්‍රීවරුන් ඔබතුමාට සහාය දැක්වීමට පැමිණ තියෙන නිසා.නොපැමිණි මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් කණගාටු වෙනවා.ඒ අයට පුද්ගලික ප්‍රශ්න තිබෙන්නට ඇති. අද ඔබතුමා නියෝජනය කරන පක්ෂයේ බොහෝ දෙනෙක් ඔබට සහය දීමට පැමිණ තිබීම ගැන අපි සතුටු වෙනවා. ඔබතුමා සියලු පක්ෂවල සියලු දෙනාට එක හා සමානව සහයෝගය දක්වන එක ගැන අපි සතුටු වෙනවා. තවද හෙට්ටිපොල නගරයේ ජනතාවට ලබාදෙන ජලයේ ජල මූලාශ්‍ර සම්බන්ධ නොයෙක් නොයෙක් ගැටලු තිබුනා. ඔබතුමා ඒ පිළිබඳ සැලකිල්ලට ගෙන හෙට්ටිපොල බස්නැවතුම්පලට හා සතිපොලට නල ළිං 2ක් ඉදිකිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමාට ස්තූති වෙනවා.ඒ වගේම මාර්ග නඩත්තුවේ දී මෝටර්ග්‍රේඩරය ලබාදී මාර්ග සංවර්ධනය කරදීමට අවශ්‍ය කටයුතු සලසා දුන්නා.සමස්තයක් විදියට අපි සියලු දෙනාගේ ගෞරවනීය ස්තූතිය පුද කරසිටිනවා.ඒ වගේම අද දවසේ 2023 වර්ෂයේ අයවැය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලු දෙනාගේ සහයෝගය ලැබෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (පො.ජ.පෙ.)</u>**

2023 වර්ෂයට අදාල අයවැය කෙටුම්පත අද දින සභාපතිතුමා විසින් ඉදිරිපත් කලා.මං දැක්ක විශේෂ කාරණා කීපයක් ගැන කියන්න හිතුවා.පසුගිය අයවැය යෝජනාව ඉදිරිපත් කරාට වඩා මේ වර්ෂයේ දී ඔබතුමා ගත්ත යෝජනා හා ක්‍රියාත්මක කරපු වැඩසටහන් මත අපිට ඔබතුමා එක්ක හොඳ තැනකට එන්න පුළුවන් වෙලා තියෙනවා.ඒ නිසා මෙ වෙනුවෙන් ඔබතුමාට සුබපතනවා. විශේෂයෙන් තවද කොට්ඨාසය පුරා සිටින ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත විශේෂ වැඩසටහන් රාශියක් තිබෙනවා. පසුගිය වර්ෂ බලනවිට අපේ ආදායම් උත්පාදන ක්‍රම අවහිර වෙලා තියෙනවා වර්තමානයේ රටේ තිබෙන ආර්ථික තත්ත්වයත් එක්ක. මම විශේෂයෙන් දැක්ක මේ අයවැය තුලින් ඔබතුමා මහජනතාවගේ සහයෝගය මත යම් යම් වැඩසටහන් ඉදිරි වර්ෂය තුල පවත්වන්න කටයුතු කරලා තිබෙන ආකාරය පිළිබඳව. මේ ආකාරයට දක්වලා තියෙන්නේ සභාවට ලැබෙන ආදායම් උත්පාදන ක්‍රම වැඩිකරන්න.පසුගිය කාලයේ චමින්ද මන්ත්‍රීතුමාගේ හා ඉන්දික මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ ඒ තිබු පාලම සංවර්ධනය කරන්න මුදල් නෑ කියලා, මුදල් හොයලා සභාවේ ශ්‍රම දායකත්වය යොදවලා, ගමේ ජනතාවගේ උදව් උපකාරයෙන් ඒ දේවල් සංවර්ධනය කලා. තවද මගේ කොට්ඨාසයේ අකරවත්ත ගමේ මහ වැව 2023 පෙබරවාරි මාසයේ සංවර්ධනය කරන්න මේ වනවිට ගමේ ස්වේච්ඡා සංවිධානයකින් මුදල් ලැබිලා තිබෙනවා. තවද මං විශේෂයෙන් මේ අයවැය තුලින් දැක්ක කාරණාවක් තියෙනවා අපේ ආදායම් අහිමි වෙච්ච සිද්ධීන් වගේම වියදම් අඩු වුන කාරණාත් කීපයක් තිබෙන බව. විශේෂයෙන් සතිපොලේ විදුලි බිල අඩු කිරීම සඳහා සෝලා පද්ධතියක් ස්ථාපිත කරන්න සැලසුම් කරලා තියෙනවා.තව බණ්ඩාර කොස්වත්ත ග්‍රාමයේ ළිඳ ස්ථාපිත කිරීම නිසා මීට කලින් වියදම් වූ මුදල් අඩු කිරීමට හැකියාව ලැබුණා. ඒ වගේම ආදායම් වැඩිකරගන්න පුළුවන් ක්‍රම 03ක් මේ අයවැය තුලින් දැක්කා. එකක් තමයි රැස්වීම් සඳහා සතිපොළ ලබාදීම, මහජන ක්‍රීඩාංගනය තුලින් ද ආදායම වැඩි කරගන්න පුළුවන්.ඒ වගේම අනිත් කාරණාව තමා සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය හා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය සියලුදෙනාගේ කැපකිරීමෙන්, සහයෝගයෙන් අපේ නගරයේ වැව සංවර්ධන කටයුතු සිදුකර එයිනුත් ආදායම වැඩිකරගන්න පුළුවන් වෙලා තියෙනවා. මේ සම්බන්ධව අවසාන වශයෙන් ඔබතුමාට ස්තූතිවන්න වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානී මෙනවිය - (පො.ජ.පෙ.)**

වසර ගාණක් සභාව නියෝජනය කරමින් මේ සභාවේ ඉන්න ජොෂ්ඨතම මන්ත්‍රීවරයෙක් හැටියට ගරු සභාපතිතුමා ඔබතුමා දේශපාලන කරලියේ නියුතුනු කෙනෙක්.අපි සතුටු වෙනවා ඔබතුමා දැන් ඉන්න තැන පිළිබඳව. තවද මේ වගේ ආසනයක ඉඳගන්න අපිට වරම් දුන්නේ අපේ ජනතාව. පඩුවස්නුවර ආසනය පුරා විසිර සිටින සමස්ත ජනතාව වෙනුවෙන් අපගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. තවද අපිට යුතුකමක් හා වගකීමක් තිබෙනවා කොට්ඨාසයේ ජනතාව වෙනුවෙන් වැඩකරන්න. ඒ නිසා විශේෂයෙන් 2023 වර්ෂයේ ඔබතුමා අයවැය කෙටුම්පත තුල බොහෝ කරුණු කාරණා එළිදක්වලා තිබෙනවා. මං හැමදාම කියනවා වගේ “උපතේ සිට සුසාන භූමිය දක්වා යනකල්” අපිට පිහිටවෙන එකම තැන පළාත් පාලන ආයතනයයි. ඉතින් ඒ ආයතනයේ ගෞරවය ආරක්ෂා කරමින් සභාපති හැටියට ඔබතුමාටත් මන්ත්‍රීවරුන් හැටියට අපිටත් අපේ කොට්ඨාසවල ජනතාව වෙනුවෙන් වැඩ කරන්න යුතුකම හා වගකීම අපිට තිබෙනවා. විශේෂයෙන් මේ අයවැය සඳහා මාගේ සුභපැතුම් එක්කර සිටිනවා. තව ද මේ වෙලාවේ මං මතක් කරනවා හිටපු අපේ සභාපතිතුමාව. එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. තවද සභාපතිතුමා ගෙනාපු 2023 අයවැයට අපේ සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කර සිටිනවා. ලේකම්තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත් අපගේ ගෞරවනීය ප්‍රණාමය සිදු කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)**

මුලින්ම මම ස්තුතිවන්ත වෙනවා මූලාසනය හොබවන සභාපති හැටියට ඔබතුමාගේ පාලන කාලය තුල දෙවැනි ප්‍රාදේශීය සභා අයවැය ඔබතුමන්ලා හමුවේ ඉදිරිපත් කිරීමට හැකිවීම ගැන.මම අයවැය ගැන නෙවෙයි කථා කරන්න හදන්නේ.අපි සියලු දෙනා නියෝජනය කරන සියලු පක්ෂ වල මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් වශයෙන් තේරී පත්වෙලා මේ සභාවට පැමිණ තිබෙන්නේ. අපි මන්ත්‍රීවරුන් වශයෙන් අපේ හෘද සාක්ෂියට නොව අපේ පක්ෂයේ ඔබේ පක්ෂයේ මතයට අනුව තමයි අපි වැඩ කටයුතු සිදු කලේ. අපි මතක් කරන්න ඕනි හිටපු සභාපතිතුමාගේ අභාවයෙන් පසුව ඔබතුමා සභාපති වශයෙන් වැඩ භාර අරගෙන කටයුතු කලා.විශේෂයෙන් මතක් කරන්න ඕනි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදිහට ඔබතුමා පළාත් පාලන අයවැයට තමන්ගේ ස්වකීය තීන්දු තීරණ ගැනීමේ අයිතිය අපිට ලබා දුන්නා. අද උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු කීපදෙනෙක් පැමිණ නැහැ.ඒ ඒ අයගේ ස්වකීය මතය අනුව කටයුතු කරන්නේ. ඔබතුමා පැරණි දේශපාලඥයෙක්, ජොෂ්ඨයෙක් විදිහට ඔබතුමා පැමිණි මග පිළිබඳ අපි සතුටුවෙනවා. අපි ඉදිරියේදී අපේ මන්ත්‍රී කාණ්ඩායම ඔබතුමාට සහයෝගය ලබාදෙයි.අපි ඡන්දය ලබා දී පෞද්ගලික දෙයක් නෙවෙයි බලාපොරොත්තු වෙන්නේ.අපිව ඡන්දයෙන් දිනවපු අපේම ජනතාව වෙනුවෙන් යම් කිසි ආර්ථික, සාමාජීය, යටිතල පහසුකම් නැංවීම තමයි අපේ බලාපොරොත්තුව වෙන්නේ. මේ වර්ෂා කාලය නිසා අපි දකිනවා වැව් බන්ට් දිගේ යද්දි මාළු පිරිලා ඉතිරිලා යනවා, සමහර නොයෙක් මාළු බන්ට් එක දිගේ ඉන්නවා, නමුත් ඒ අයගේ හැසිරීම අනුව තමයි ඒ අයගේ විනාශය. අපි හිතනවා ඒ වැවේ සමස්ත මාළු තමා මේ බන්ට් එක දිගේ ඉන්නේ කියලා.නමුත් ඒ සමස්ත මාළු ප්‍රමාණය නෙවෙයි. තව ඇති තරම් මාළු ඒ වැවේ ඉන්නවා, නමුත් ඒ අයගේ අදහස්, මත අනුව ඒ අය ඉදිරියේ දී තීන්දු තීරණ ගනියි.

ඉතින් මං කියන්නේ මේ සිටින සෑම මන්ත්‍රීවරයෙක්ට ම ලැබෙන වැසිකිළි ආධාරය, වීදි ලාම්පුව , මෝටර් ග්‍රේඩරය, පළාත් පාලන ආයතන තුලින් ලැබෙන ප්‍රතිපාදන අරගෙන තමන්ගේ ප්‍රදේශයට වැඩ කටයුතු කරන්න. මං බෞද්ධයෙක් විදියට කියනවා අපේ බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලබද්දිත් දේවදත්තලා හිටියා.දේවදත්තලා හැමවෙලේම කලේ බුදුරජාණන් වහන්සේගේ චරිතය කෙලෙසීම ,විනාශකිරීම.අපි දැකලා තියෙනවා අපේ බෞද්ධ දර්ශනය තුල අජාසත්තලා, අංගුලිමාලලා රහත් වුනා. නමුත් දේවදත්ත අපාගත වුනා. දේවදත්තලා වගේ වෙන්න එපා.අංගුලිමාලලා ගුරු මුෂ්ටිය රකින්න තමයි ඇඟිලි කපලා ඒ වගේ දේවල් කලේ. නමුත් ධර්මතාවය අනුව ඒ අය රහත් වුනා. අපි දන්නේ නෑ ආණ්ඩුව ඉදිරියේ දී මොන තීන්දු තීරණ ගනිද කියලා. මේ පළාත් පාලන ආයතන ඉදිරියට පවත්වාගෙන යයිද විසුරුවයිද කියලා අපි දන්නේ නෑ. මැතිවරණයකට යයිද කියලා අපි දන්නේ නෑ.අපි කීයෙන් කීදෙනෙක් ඒකට ඉදිරිපත් වෙයිද, ජයගනිවිද කියලා දන්නේ නෑ.ඒක කාලයට බාරයි.ජනතාහිතවාදී පාලනයක් මේ පළාත් පාලන ආයතන

තුළ ඔබතුමාට ඇති කරන්න හැකිවේවා. අපි ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා මේ අයවැය කෙටුම්පත් කරන්න දැරූ වෙහෙස මහන්සියට.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමනි,මම සභාපතිවරු 05දෙනෙක්ගේ පමණ අයවැයට සම්බන්ධවෙලා තියෙනවා. එක එක යුගවලදී අයවැය සම්බන්ධ ප්‍රශ්න ඇති වුණා.එක වතාවක් අපි අයවැය පරාද කළා.එහෙම තත්වයක් එදා සභාපතිවරයා ඇති කරගෙන තිබුණා.නමුත් අද කිසිම ප්‍රශ්නයක් නෑ. මම සතුටුවෙනවා අද සියලුදෙනාම වගේ ඇවිත් ඉන්නවා.මේ තත්වය ඇතිකර ගත්තේ ඔබතුමාගේ යහපත් වැඩපිළිවෙල නිසයි. ඉදිරියටත් මන්ත්‍රීවරුන් ඔබතුමාට සහාය ලබාදෙයි. 2023 ට අයවැය ඉදිරිපත් කරලා ඒ අයවැය ක්‍රියාත්මක කරන්න අපේ සහයෝගය ලබාදෙනවා. ඒ වගේම ඔබතුමාට සුබ පතනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

මීළඟට වයඹ පළාත් ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමා විසින් 2020 ඔක්තෝබර් 28 දාතමින් ඉදිරිපත් කර ඇති 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති මාලාවේ අංක 12.(3) රීතිය යටතේ 2023 වර්ෂයේ අයවැයට අදාල ඡන්ද විමසීම සඳහා ලේකම්තුමාට අවස්ථාව ලබා දෙනවා.

- ❖ වයඹ පළාත් ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමා විසින් 2020 ඔක්තෝබර් 28 දාතමින් ඉදිරිපත් කර ඇති 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති මාලාවේ අංක 12.(3) රීතිය යටතේ ලේකම්වරයා විසින් එක් එක් මන්ත්‍රීවරයාගේ නමින් ප්‍රමුඛතාවයේ අනුපිළිවෙලට ඡන්දය විමසන ලද අතර,ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් පහත ආකාරයට 2023 වර්ෂයේ අයවැය වෙනුවෙන් ඡන්දය ලබා දෙන ලදී.

| අනු අංකය | නම | පක්ෂව | විපක්ෂව | එදින සභාවට නොපැමිණි |
|---|---|---|---|---|
| 01 | ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා | ✓ | | |
| 02 | ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා | | | ✓ |
| 03 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා | ✓ | | |
| 04 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍රජයතිලක මහතා | ✓ | | |
| 05 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී මොහම්මදු තාහීර් මොහම්මදු ජාබීර් මහතා | | | ✓ |
| 06 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා | ✓ | | |
| 07 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා | ✓ | | |
| 08 | ප්‍රා.ස.ගරු මන්ත්‍රීනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය | ✓ | | |
| 09 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා | | | ✓ |
| 11 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා | ✓ | | |
| 12 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා | | | ✓ |
| 13 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා | ✓ | | |
| 14 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා | ✓ | | |
| 15 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා | | | ✓ |
| 16 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා | ✓ | | |
| 17 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා | ✓ | | |
| 18 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා | ✓ | | |
| 19 | ප්‍රා.ස.ගරු මන්ත්‍රීනී අයි.එස්.දිල්හානි ප්‍රනාන්දු මහත්මිය | ✓ | | |
| 20 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා | ✓ | | |
| 21 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා | | | ✓ |
| 22 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා | ✓ | | |
| 23 | ප්‍රා.ස.ගරු මන්ත්‍රීනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය | ✓ | | |
| 24 | ප්‍රා.ස.ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය | ✓ | | |
| 25 | ප්‍රා.ස.ගරු මන්ත්‍රීනී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය | ✓ | | |
| 26 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා | ✓ | | |
| 27 | ප්‍රා.ස.ගරු මන්ත්‍රීනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය | ✓ | | |
| 28 | ප්‍රා.ස.ගරු මන්ත්‍රීනී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය | ✓ | | |
| 29 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| 30 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා | ✓ | | |
| 31 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා | ✓ | | |
| 32 | ප්‍රා.ස.ගරු මන්ත්‍රිනී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය | ✓ | | |
| 33 | ප්‍රා.ස.ගරු මන්ත්‍රිනී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය | ✓ | | |
| 34 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා | | ✓ | |
| 35 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී සේකාදි මුහම්මදු පයිසර් මහතා | ✓ | | |
| 36 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා | ✓ | | |
| 37 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා | ✓ | | |
| 38 | ප්‍රා.ස.ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා | | | ✓ |

**මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව - 38**

**2022.10.25 දින සභාව සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව - 31**

**2022.10.25 දින සභාව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව-07**

**යෝජනාවට පක්ෂ ඡන්ද ප්‍රමාණය - 30**

**යෝජනාවට විපක්ෂ ඡන්ද ප්‍රමාණය - 01**

**වැඩි ඡන්ද සංඛ්‍යාව-29**

- ❖ වයඹ පළාත් ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමා විසින් 2020 ඔක්තෝබර් 28 දාතමින් ඉදිරිපත් කර ඇති 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති මාලාවේ අංක 12.(4) රීතිය යටතේ ගරු සභාපති විසින් ඡන්ද ප්‍රථිපල සභාවට නිවේදනය කරන ලදී.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ අයවැයට අදාල ඡන්ද විමසීම අනුව සභාවේ මුළු මන්ත්‍රීවරුන් 38 දෙනාගෙන් ගරු මන්ත්‍රීවරුන් 31 දෙනෙකු සභාව සඳහා සහභාගී වුනා. ගරු මන්ත්‍රීවරුන් 07 දෙනෙකු සභාව සඳහා සහභාගී නොවුණා. 2023 වර්ෂයේ අයවැය වෙනුවෙන් පක්ෂව ඡන්ද 30 ක් ලැබුණු අතර විපක්ෂව ඡන්ද 01ක් පමණක් ලැබුණා.ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ අයවැය වැඩි ඡන්ද 29 කින් සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වා සිටිනවා. 2023 වර්ෂයේ අයවැය වෙනුවෙන් ඡන්දය ලබා දුන් ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාටම ස්තුතියි.මේ සම්මත වූ අයවැය ඉදිරි වර්ෂය තුල පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමටත් ජනතාවට අවශ්‍ය සියලු සේවාවන් බල ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් ඉටු කිරීමටත් මා බලාපොරොත්තු වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා - (එ.ජා.ප.)</u>**

මගේ හදවතට දැනුන ආකාරයට මම මේ කවිය කියන්නේ.

විසිතුන සම්මතයි අයවැය පෙරට්ටුවේ
බහුතරයක්ම මැතිවරු ඇති පොහොට්ටුවේ
නැත අද දිනේ මූලාසෙනෙ රැවැට්ටුවේ
නොපැමිණි අයගේ තතු ලියවෙයි කැරැට්ටුවේ

ඉදිරිය හොඳයි අයවැය දෙක ඇත ගැලපී
අපි දුන්නොතින් ගල් උඩ මල් දිලෙයි පිපී
සමහරු සභය දෙන ලෙස දුන්නාට ටොපී
දැතම උස්සනවා අද අපි හරිම හැපී

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168-1 වගන්තිය යටතේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අදාලව 2023 වර්ෂය සඳහා සකස් කල අයවැය පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ වැඩි ඡන්ද 29 කින් සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168-1 වගන්තිය යටතේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අදාලව 2023 වර්ෂය සඳහා සකස් කල අයවැය පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ වැඩි ඡන්ද 29 කින් සභා සම්මත විය.**

**06.කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම - නැත.**
**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම - නැත.**
**08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට -නැත.**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත්,සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ප.ව.12.20 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කළේ : ඩබ්.එම්.එන්.ප්‍රියදර්ශනී, සංවර්ධන නිලධාරී
වාර්තා කළේ : එච්.ඒ.ජී.නිශ්ශංක,ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.